00273

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන- 6 වන මට්ටම 2020/2021
අවසාන පරීක්ෂණය
**EPU6231 - ප්‍රාථමික පාසල් සැකසුම් තුළ මාර්ගෝපදේශනය සහ උපදේශනය.**
කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2023.03.12 වේලාව - පෙ.ව.09.30 - පෙ.ව.11.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**1 වන කොටස**

01. 'මාර්ගෝපදේශනය' සහ 'උපදේශනය' යන පද නිර්වචනය කරන්න.

02. අපට මාර්ගෝපදේශනය සහ උපදේශනය අවශ්‍ය වන්නේ ඇයි ? උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

03. උපදේශකවරයකුගේ ලක්ෂණ ලැයිස්තුගත කරන්න.

04. උදාහරණ දෙමින් සමායෝජිවීමේ ගැටළු යන පදය නිර්වචනය කරන්න.

05. පාසල් භීතිකාවේ ලක්ෂණ (symptoms)ලැයිස්තුගත කරන්න.

06. දරුවන්ගේ සමායෝජිවීමේ ගැටළු මතුවීම සඳහා බලපාන සාධක දෙකක් **(02)** විස්තර කරන්න.

07. දරුවාගේ සාමාන්‍ය වර්ධනයේ අංශවල වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

08. (Maslow's) මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලියෙහි පිරමීඩය ඇඳ නම් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) මාර්ගෝපදේශනයේ සහ උපදේශනයේ මූලධර්ම අගයන්න. (ලකුණු 08)

(ii) තනි පුද්ගල සහ සමාජ මට්ටමින් මාර්ගෝපදේශනය සහ උපදේශනය සඳහා අවශ්‍යතාව සාකච්ඡා කරන්න. (ලකුණු 12)

10. (i) උපදේශන ක්‍රියාවලියේ විවිධ අවධීන් ගවේෂණය කරන්න. (ලකුණු 08 )

(ii) දෙවන ශ්‍රේණියේ පන්ති කාමරයේ චර්යාමය ගැටළුවක් සහිත ශිෂ්‍යයකු තෝරා ගන්න. එම ශිෂ්‍යයාගේ හැසිරීම් විස්තර කර ප්‍රාථමික පාසලේ දෙවන ශ්‍රේණියේ ගුරුවරයකු ලෙස ශිෂ්‍යයාගේ ගැටළුව විසඳා ගතයුතු ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 12 )

11. (i) ළමා සංවර්ධනයේ දාර්ශනික පැතිකඩ විස්තර කරන්න. (ලකුණු 08)

(ii) බුද්ධිමය හා සමාජ සාධක දරුවාට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

12. (i) ප්‍රාථමික පන්ති කාමරයක හැසිරීම් කළමනාකරණයට අදාළ ගැටළුවක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ඔබ හඳුනාගෙන ඇති ගැටළුවේ ලක්ෂණ මොනවා ද? (ලකුණු 06)

(iii) ඔබ මෙම ගැටළුව අවම කර ගැනීමට කටයුතු කරන්නේ කෙසේ ද? (ලකුණු 10)

13. දැනට ශ්‍රී ලංකාවේ උපදේශන සේවා සපයන එක් ආයතනයක් තෝරා ගන්න. පහත කරුණු සලකා බලා කෙටි වාර්තාවක් ලියන්න.

අ) ආයතනය පිළිබඳ කෙටි විස්තරයක් (ලකුණු 04)

ආ) ආයතනය විසින් සපයනු ලබන සේවාවන් (ලකුණු 06)

ඇ) ආයතනය මගින් පාසල් දරුවන්ට සපයන එක් සේවාවක් තෝරාගෙන ඒ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 10)

- හිමිකම් ඇව්රිණි. -